# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බීඩී/සීබීපී/4/1/23-2015
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2015.03.31

**ජාතික අයවැය චක්‍රලේඛ අංක: 2/2015**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය වියදම් කළමනාකරණය - 2015 මුල්‍ය වර්ෂය**

2015 අංක 1 දරණ විසර්ජන (සංශෝධන) පනත යටතේ 2015 අයවැය ඇස්තමේන්තු මගින් එක් එක් වියදම් ආයතන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගෙන වැය දැරීමේ අධිකාරී බලය පිළිබඳව 2015.02.19 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 01/2015 මගින් දැනටමත් ඔබ දැනුවත් කර ඇත.

02. 2015 වර්ෂයේ වියදම් දැරීම සඳහා දැනට වෙන් කර ඇති ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන මෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගෙන් හා ගණන්දීමේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**03. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම.**

2015.01.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2015 සංශෝධිත අයවැයට අදාළව ගරු මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනා ගෙන ඇති බැවින්, ඒවා කඩිනමින් හා ජනතාවට උපරිම සහන සැලසෙන අයුරින් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික අවධානය යොමු කළයුතු වේ. එම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මුල්‍ය ප්‍රතිපාදන දැනට ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ වෙන්කර ඇත. එබැවින්, ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළයුතු අයවැය යෝජනාවක් වේ නම්, ඒ පිළිබඳව වන සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු වේ. ඒ අනුව, අවශ්‍ය අයවැය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් උත්පාදනය පිළිබඳව වන හෝ ප්‍රතිපාදන අවශ්‍ය නොවන අයවැය යෝජනා සම්බන්ධයෙන් හැකි ඉක්මණින් අදාළ කටයුතු ආරම්භ කර, යෝජනාව ක්‍රියාත්මක කිරීමට මෙන්ම ඒ පිළිබඳව භාණ්ඩාගාරය දැනුවත් කිරීමට ද කටයුතු කළයුතුය. එසේම, අයවැය යෝජනාවල ප්‍රගතිය සම්බන්ධයෙන් නිරන්තර සමාලෝචනයක් කළහැකි වන පරිදි අදාළ තොරතුරු ලබාදීම සඳහා වගකිවයුතු නිලධාරියෙකු ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් නම් කළයුතුය.

## 04. බැඳීම් කළමනාකරණය

සියළුම ආයතන විසින් ස්වකීය බැඳීම් කළමනාකරණය සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කළයුතුය. එහිදී 2014.12.31 දිනට නිරවුල් කළයුතු සංවර්ධන වැඩසටහන්වලට අදාළ වූ සියළු බැඳීම් සඳහා 2015 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබේ නම් 2015 වර්ෂය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් අදාළ බැඳීම් නිරවුල් කර ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය නැවත ප්‍රමුඛතාගත කිරීමට කටයුතු කළයුතුය. ඒ අනුව, අඩු ප්‍රමුඛතාවයක් හිමිවන ව්‍යාපෘති ඉදිරි වර්ෂවල මැදිකාලීන අයවැය රාමුව තුලින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව ද අවධානය යොමු කළයුතුය.

## 05. අතිරේක ප්‍රතිපාදන

2015 වර්ෂයේදී අතිරේක ප්‍රතිපාදන ලබාදීම අතිශයින් සීමා කිරීමට උපදෙස් ලැබී ඇති බැවින්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් ස්වකීය වැය ශීර්ෂ යටතේ වන වියදම් සම්බන්ධයෙන් මනා පාලනයක් පවත්වා ගතයුතු වේ. එසේම අයවැය යෝජනා, අත්‍යවශ්‍ය හා අනපේක්ෂිත වියදම් සඳහා හැර වෙනත් කරුණු සඳහා වන අතිරේක ප්‍රතිපාදන සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. එබැවින්, පවත්නා ප්‍රතිපාදන තුල වියදම් කළමනාකරණය කර ගැනීමට කටයුතු කළයුතු අතර, ප්‍රතිපාදන සීමාව ඉක්මවා ඇති කරගනු ලබන බැඳීම් සඳහා භාණ්ඩාගාරය වගකීම භාරගනු නොලැබේ.

## 06. වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ අයවැය ප්‍රතිපාදන මාරු කිරීම්

ගිණුම් වර්ෂය අවසන් වූ පසුව (දෙසැම්බර් 31 ට පසුව) මු.රෙ. 66 මාරු කිරීම් සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කරනු නොලැබේ. වර්ෂය අවසන් වූ පසුව ගිණුම්කරණමය වැරදි නිවැරදි කිරීම සඳහා වන මු.රෙ.69 යටතේ වන මාරු කිරීම් පමණක් සලකා බලන අතර, ඒවා ද නියමිත දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට වගබලාගත යුතුය.

## 07. වාහන භාවිතය

2015 වර්ෂය තුල රාජ්‍ය ආයතන සඳහා අළුතින් වාහන ලබාදීමට කටයුතු නොකරන අතර, දැනට ඇති වාහන කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීමට කටයුතු කළයුතුය.

මුල්‍ය කල්බදු ක්‍රමය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති වාහන එම දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් ආයතන වෙත මාරු කිරීමට කිසිදු ආයතන ප්‍රධානියෙකුට බලය පවරා නොමැත. එම නිසා එම වාහනවල අයිතිය පිළිබඳව සිදු කරනු ලබන සියළු වෙනස්වීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව දැනුවත්ව සිදු කළයුතු බව අවධාරණය කරමි.

එසේම, 2015.01.29 දින මුදල් අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රතිශෝධිත අයවැයට අදාළ ආදායම් යෝජනාවල අංක 8.51 අනුව, රාජ්‍ය ආයතන සතු අබලන් වූ/භාවිතා කිරීමට නොහැකිව අතහැර දමා ඇති වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යෝජනා කර ඇත. මෙහිදී මෝටර් වාහන මෙන්ම බස් රථ, දුම්රිය, ලොරි රථ හා අනෙකුත් වාහන ද අදාළ වේ. එම කටයුතු 2015.06.30

දින වනවිට නිම කිරීමට හැකිවන පරිදි මු.රෙ.756(4) ප්‍රකාරව විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අපහරණය සඳහා සුදුසු වාහන හඳුනාගත යුතුය. මෙම මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වියයුතුය.

| | | |
|---|---|---|
| සභාපති | - | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු |
| සාමාජික | - | යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු /කාර්මික නිලධාරියෙකු |
| සාමාජික | - | ආයතනයේ වත්කම් සම්බන්ධයෙන් වගකීම දරණ මාණ්ඩලික නිලධාරියෙකු |

අපහරණය කළයුතු වාහන පිළිබඳ තොරතුරු ආකෘති අංක 01 අනුව 2015.04.10 දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළයුතු අතර, මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ඉදිරියේදී ලබාදෙනු ඇත.

මෙම චක්‍රලේඛය යටතේ අපහරණය කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ ලියාපදිංචි කළ දින සිට වසර 10 ඉක්මවා ඇති වාහන පමණි. එසේ වුවද, වාහනය අනාර්ථික බවට තාක්ෂණික දැනුම සහිත පුද්ගලයින්ගෙන් සමන්විත කමිටුවක් මගින් තීරණය කරනු ලබන වාහන, සුන්බුන් ලෙස පවතින වාහන හා විශේෂිත ලෙස හඳුනාගත් වාහන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව අපහරණය කිරීම සිදුකල හැකිය.

සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් අපහරණය කළයුතු වාහන මොනවාද යන්න සම්බන්ධයෙන් වන අවසාන තීරණය ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් ම සිදුකල යුතුය.

## 08. ප්‍රචාරණය හා අනුග්‍රහ දැක්වීමේ වියදම්

රජයේ ආයතන විසින් මෑත කාලයේදී විවිධ ප්‍රචාරණ කටයුතු සහ අනුග්‍රහ දැක්වීම් සඳහා රජයේ අරමුදල් භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, රජයේ අරමුදල් අනිසි භාවිතයන් වැළැක්වීම සඳහා එවැනි වියදම් ඉදිරියේදී සිදු නොකිරීමට සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් වගබලාගත යුතුය.

මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් කෙරෙහි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ/ගණන්දීමේ නිලධාරීන්ගේ පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

ආකෘති අංක:01

**රාජ්‍ය ආයතනවල අපහරණය කළයුතු වාහන හඳුනා ගැනීම.**

**අමාත්‍යාංශය:**

**දෙපාර්තමේන්තුව / ආයතනය:**

| අනු අංකය | වාහන අංකය | වර්ගය/මාදිලිය | *ගැණුම් මිල | *මිලදී ගත් දිනය හෝ වර්ෂය | එන්ජින් ධාරිතාව | *ධාවනය කර ඇති දුර ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(*තොරතුරු පවතී නම් සඳහන් කරන්න)

සකස් කළේ:- ...................................

පරීක්ෂා කළේ:- ...................................

.........................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව